No.306/72, Polduwa Road,
Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පර්පාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පර්පාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පර්පාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ප්‍රමිත අංක - 02

තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කළ යුතු වුවත් අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව පිරිවැය පදනම් කර ගෙන තොග වටිනාකම ගණනය කර තිබුණි.

(ආ) ප්‍රමිත අංක - 24

රජයේ ප්‍රදානවලින් මිලදීගත් ස්ථාවර වත්කම් සඳහාවු ක්ෂය ප්‍රතිපාදනය 100% විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද , 26.78 % ක ප්‍රමාණයක් පමණක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඉතිරිය සම්බන්ධයෙන් ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු විගනණයේ දී නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර තැන්පතු පොලී ආදායම් රු 371,252 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී බැංකුව අයකරන ලද බැංකු ගාස්තු රු.70,073 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදලට වඩා රු. 1,100,948 ක් ගිණුම්වල දැක්වීම හේතුවෙන් කෙරීගෙනයන වැඩ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සේවයෙන් විශ්‍රාම ගන්නා ලද සේවකයින් 11 දෙනෙකුගෙන් අය වියයුතු රු. 885,823 ක ණය ශේෂ අයකර ගෙන නොතිබුණු අතර එම වටිනාකම ගිණුම්වලද දක්වා නොතිබුණි.

(ඉ) 2008 හා 2009 වර්ෂ සඳහා ඩයලොග් සමාගමෙන් ලැබිය යුතු රු.672,000 ක කුලී ආදායම ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) දුරකථන සමාගම් තුනකින් ලැබුණ ආදායම් මත අයකළ යුතු එකතු කළ අගය මත බදු මුදල රු.186,656 ක් අයකර ගෙන නොතිබුණි.

(උ) කටුනායක ජාතික මධ්‍යස්ථානය, වැල්ලවත්ත බේරුවල සහ කල්මුණේ යන පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම් පවරාගෙන නොතිබු අතර එම පුහුණු මධ්‍යස්ථාන පිහිටි ඉඩම්වල අධිකාරිය විසින් ගොඩනැගිලි ඉදිකර තිබුණි.

(ඌ) ගෙවිය යුතු විගණන ගාස්තු රු. 114,964 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) විදේශගතවූ සේවකයින් දෙදෙනෙකුගෙන් ගිවිසුම් කඩකිරීම නිසා අයවිය යුතු රු.7,367,731 ක් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන නොතිබුණු අතර එම මුදල ගිණුම්වලද හෙළිදරව් කර නොතිබුණි.

(ඒ) බැංකු ගිණුම් හයක රු. 629,376 ක්වූ ශේෂයන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

2.2.3 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ගිණුම් 12 ක ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛණවල දැක්වෙන සංඛ්‍යාවන් අතර රු.5,256,783 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ශේෂ පිරික්සුමේ හා අවසන් ගිණුම් අනුව දැක්වෙන ශේෂයන් අතර රු. 10,856,229 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.33,759,448 ක් වූ ණයගැතියන්ගේ හා රු.33,417,017 ක් වූ ණයහිමියන්ගේ ශේෂ සනාථ කිරීම් ලබාගෙන නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් කාර්යාලවලට අදාළ රු.17,513,629 ක ශේෂ නිරවුල් කර නොතිබූ අතර ඒ වෙනුවෙන් බොල් හා අඩමාණ ණය සඳහා 5% ක ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඇ) මුළු එකතුව රු. 33,417,017 ක් වූ ණයහිමි ශේෂවලින් රු.3,234,236 ක් වූ ශේෂ වර්ෂ 06 ක කාලයක්ද, රු. 2,103,803 ක ශේෂ වර්ෂ10 ක කාලයක්ද ඉක්මවා තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| තොගය | 11,365,410 | සමීක්ෂණ මණ්ඩල වාර්තා ,විස්තරාත්මක උපලේඛණ |
| ඉඩම් | 46,939,652 | අයිතිය තහවුරු කෙරෙන හිමිකම් ඔප්පු |
| අත්තිකාරම් | 23,940,366 | ශේෂ සනාථ කිරීම් |
| බැංකු හා මුදල් ශේෂ | 41,095,486 | - එම - |
| විවිධ ණයගැතියෝ | 33,759,448 | ශේෂ සනාථ කිරීම් |
| ණයහිමියෝ | 33,417,017 | ශේෂ සනාථ කිරීම් |
| ස්ථාවර තැන්පතු | 6,307,875 | ස්ථාවර තැන්පතු සහතික |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගන්නා ලද අතිරික්තතා හා ඌණතා සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර නොතිබූ අතර අවසන් තොගය, වාහන සහ උපකරණ සම්බන්ධයෙන් සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/3 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අයකර දේශිය ආදායම් කොමසාරිස්ට ගෙවිය යුතු වුවත්, එලෙස කටයුතු කර නොමැති අවස්ථා 87 ක් නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| i | මු.රෙ. 188 (2) | | 1999 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කර ඇතත් උපලබ්ධි නොවූ රු. 25,961 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| ii | මු.රෙ. 264 (1) | | සෑම ගෙවීමක් සඳහාම ආදායකයාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතු වුවත්, රු.990,935 ක් වූ ගෙවීම් වවුචර 22 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතුකර නොතිබුණි. |
| iii | මු.රෙ. 371 (2) (ඇ) | | දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළයුතු වුවත්, රු.41,804,696 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |
| iv | මු.රෙ. 396 | | වලංගු කාලය ඉක්මවූ රු.247,303 ක් වූ චෙක්පත් 32 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| i 1992 අගෝස්තු 17 දිනැති අංක 26 / 92 හා 1997 අගෝස්තු 03 දිනැති අංක 26 / 92 (1) | චක්‍රලේඛවල විධි විධාන අනුව වෙන්කළ වාහන හැර ඉතිරි වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කළයුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| ii 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1.1.6(v) හා 1.3.1 (iii) වගන්තිය | චක්‍රලේඛයේ විධි විධානවලට පටහැනිව, කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාදිය යුතු නිලධාරීන් 08 දෙනෙකුට වෙන් වෙන් වශයෙන් වාහන ලබාදී තිබුණි. |

(ඈ) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ

| | |
|---|---|
| 2003 ජුනි 02 දිනැති පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 යන වගන්ති | රාජ්‍ය ව්‍යාපාරයන්ගේ සම්පත් අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට නොගත යුතු බවට වූ විධිවිධාන පිළිබඳ සැළකිල්ලක් නොදක්වා අධිකාරියේ වාහනයක් අමාත්‍යාංශයට මුදාහැර ඒ සඳහා රු.438,427 ක වියදම් කර තිබුණි. |

(ඉ) 2006 ජනවාරි 25 දිනැති අංක එන්පීඒ/8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ චක්‍රලේඛය

| | |
|---|---|
| i 3.1.4, 3.2.2 සහ 3.4.2 වගන්ති | රාජ්‍ය වැඩ හා සේවාවන් හැකිතාක් දුරට තරඟකාරීව මිලගණන් කැඳවා සිදු කළ යුතු වුවත් අධිකාරියේ සැපයුම් හා සේවා ලබා ගැනීමේදි ඒ අනුව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |
| ii 3.4.1(ඇ) වගන්තිය | රුපියල් මිලියන 50 - 150 ත් අතර ඉදි කිරීම් වැඩ ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් මගින් (MPC) අවම වශයෙන් ඉදි කිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පස් දෙනෙකුගෙන්වත් මිල ගණන් කැඳවිය යුතු වුවත් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |
| iii 8.13.3 වගන්තිය | කොන්ත්‍රාත් විචලනය අනුමත අසම්භාව්‍ය වෙන්කිරීම් සීමාව ඇතුළත විය යුතු අතර එය කොන්ත්‍රාත් වටිනාකමින් 10% ඉක්මවිය නොහැකි වුවද එම සීමාව ඉක්මවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. |

2.2.7 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1963 නොවැම්බර් 30 දිනැති අංක 1024 එෆ්/600/29 සීඩී දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "රාජ්‍ය සංස්ථා" අප්‍රමාදව මූල්‍ය සහ පරිපාලන රෙගුලාසි සම්පාදනය කර ඒ සඳහා අදාළ අමාත්‍යාංශවල අනුමැතිය ලබාගත යුතු අතර එකී රෙගුලාසි සම්පාදනය කර ගන්නා තෙක් රජයේ

මූල්‍ය සහ පර්පාලන රෙගුලාසි අනුගමනය කළ යුතුය. කෙසේ වුවද, අධිකාරිය ඊට අනුකූල වී යථෝක්ත රෙගුලාසි සකස් කරගෙන නොතිබුණු අතර රජයේ මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරමින් තිබූ නමුත් නිලධාරීන්ගේ වාර්ෂික නිවාඩු සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් පමණක් සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධාන අනුගමනය කර තිබුණි.

2.2.8 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ සේවා කාලය වසර 3 ක්වූ නිලධාරීන් දෙදෙනෙකුට තම තනතුරේ කාර්යය ක්ෂේත්‍රයට අදාළ නොවන පාඨමාලාවන් හැදෑරීම සඳහා රු.180,000 ක් ගෙවා තිබුණි.

(ආ) එක් අයකු වෙනුවෙන් රු. 75,000 ක වැය කර ගිවිසුමකට එළඹීමෙන් තොරව උපදේශකවරුන් 08 දෙනෙකු පුහුණු පාඨමාලාවකට යොමුකර තිබුණි. එයින් 05 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණු අතර, තවත් දෙදෙනෙකු සේවය හැරයාම නිසා රජයට සිදු වූ පාඩුව රු. 187,400 ක් විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් රු.75,837,077 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.5,007,604 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌණතාවයෙහි රු.70,829,473 ක වැඩිවීමක් පෙන්නුම් කෙරෙන අතර, එම වැඩිවීම පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය.

| විස්තරය | විචලනය | | |
|---|---|---|---|
| | හිතකර | අහිතකර | එකතුව |
| | රු. | රු. | රු. |
| **ආදායම්** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා ප්‍රදාන/ආධාර - රජයේ | - | 2,200,000 | - |
| - වෙනත් | - | 6,025,761 | - |
| නිෂ්පාදන හා පුහුණු අංශවලින් ඉපයූ ලාභ | 2,406,353 | - | - |
| අනෙකුත් ආදායම් | 14,270,078 | - | - |
| විලම්භිත ආදායම් මාරු කිරීම් | 36,516,560 | - | - |
| | 53,192,991 | 8,225,761 | 44,967,230 |
| **වියදම්** | | | |
| ආයතන හා පර්පාලන වියදම් | - | 84,139,681 | - |
| ආධුනික පුහුණු වියදම් | - | 31,657,022 | - |
| | - | 115,796,703 | - |
| ඌණතාවයෙහි ශුද්ධ වැඩිවීම | | | 70,829,473 |

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය ඉකුත් වර්ෂය සමග වූ විචලනයන් පහත දැක්වේ.

මූල්‍ය තත්ත්වය

| ජංගම නොවන වත්කම් | 2011 | 2010 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| දේපල, පිරියත හා උපකරණ | 695,392,889 | 419,827,153 | 65.64 |
| කෙරගෙන යන ප්‍රාග්ධන වැඩ | 26,242,970 | 64,305,802 | (59.19) |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11,365,410 | 10,528,029 | 7.95 |
| ලැබිය යුතු ශේෂ | 77,311,464 | 75,461,890 | 2.45 |
| තැන්පතු කලින් ගෙවීම් හා අත්තිකාරම් | 49,436,018 | 11,938,512 | 314.09 |
| කෙටිකාලීන ආයෝජන | 38,547,183 | 35,579,071 | 8.34 |
| මාර්ගස්ථ මුදල් | 7,463,725 | 25,556,075 | (70.79) |
| මුදල් හා බැංකු ශේෂ | 41,095,486 | 40,696,390 | 0.98 |
| **ස්කන්ධය** | | | |
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අරමුදල | 304,919,126 | 344,180,565 | (11.41) |
| ප්‍රාග්ධන සංචිතය | 1,424,714 | 1,424,714 | - |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 131,313,097 | 123,584,940 | 6.25 |
| විලම්භිත ආදායම් ප්‍රදාන | 388,092,268 | 115,405,689 | 236.29 |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ශේෂ | 121,105,941 | 99,297,014 | 21.96 |

3.3 වියදම්වල වැඩිවීම හා ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම්වල හා ජංගම වත්කම්වල වෙනස්වීම් හා ද්‍රවශීලතා අනුපාතයන් පහත දැක්වේ.

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| ශුද්ධ වත්කම් | 306,343,840 | 345,605,279 |
| ශුද්ධ ජංගම වත්කම් | 104,113,345 | 100,462,953 |
| ජංගම අනුපාතය | 1.86:1 | 2.01:1 |
| ක්ෂණික අනුපාතය | 1.77:1 | 1.91:1 |

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යය සාධනය

අධිකාරියේ පුහුණු ආයතනවලට වාර්ෂිකව බඳවා ගත් සිසුන්, වර්ෂය තුළ පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සහ වර්ෂය අවසානයට පාඨමාලා හදාරමින් සිටි සිසුන් පිළිබඳ විස්තරයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දක්වා ඇත.

| | 2011 | | | | 2010 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පළාත / පුහුණු මධ්‍යස්ථානය | වර්ෂය ආරම්භයේ සිටි සංඛ්‍යාව | වර්ෂය තුළ බඳවාගත් සංඛ්‍යාව | වර්ෂයතුළ පාඨමාලා සම්පූර්ණ කළ සංඛ්‍යාව | වර්ෂය අවසානයට පාඨමාලා හදාරමින් සිටි සංඛ්‍යාව | වර්ෂය ආරම්භයේ සිටි සංඛ්‍යාව | වර්ෂය තුළ බඳවාගත් සංඛ්‍යාව | වර්ෂය තුළ පාඨමාලා සම්පූර්ණ කළ සංඛ්‍යාව | වර්ෂය අවසානයට පාඨමාලා හදාරමින් සිටි සංඛ්‍යාව |
| යාපනය | 1,280 | 1,300 | 908 | 1,396 | 1123 | 1,075 | 918 | 1,280 |
| කිලිනොච්චි | 502 | 1,125 | 247 | 1,153 | 42 | 460 | - | 502 |
| මුලතිව් | 28 | 369 | 32 | 345 | - | 28 | - | 28 |
| වවුනියා | 852 | 497 | 653 | 594 | 834 | 886 | 868 | 852 |
| මන්නාරම | 1,068 | 674 | 936 | 674 | 847 | 676 | 455 | 1,068 |
| අනුරාධපුරය | 760 | 1,058 | 870 | 738 | 411 | 1,109 | 762 | 760 |
| පොලොන්නරුව | 438 | 689 | 295 | 692 | 280 | 496 | 338 | 438 |
| ත්‍රිකුණාමලය | 504 | 1,454 | 1,034 | 696 | 526 | 717 | 1,057 | 504 |
| පුත්තලම | 364 | 474 | 226 | 517 | 425 | 529 | 274 | 364 |
| කොළඹ | 5,045 | 2,360 | 3,620 | 2,964 | 4036 | 2,339 | 2,016 | 5,045 |
| ගම්පහ | 1,557 | 1,213 | 1,018 | 1,517 | 1345 | 1,429 | 811 | 1,557 |
| රත්නපුර | 749 | 618 | 487 | 752 | 629 | 721 | 468 | 749 |
| කුරුණෑගල | 954 | 1,251 | 539 | 1,295 | 828 | 1,461 | 983 | 954 |
| කෑගල්ල | 614 | 809 | 189 | 1,064 | 546 | 713 | 400 | 614 |
| මහනුවර | 1,243 | 1,256 | 1,169 | 1,083 | 1159 | 1,314 | 944 | 1,243 |
| මාතලේ | 667 | 757 | 301 | 994 | 498 | 873 | 714 | 667 |
| නුවරඑළිය | 912 | 785 | 835 | 708 | 876 | 681 | 192 | 912 |
| මඩකලපුව | 606 | 764 | 414 | 629 | 628 | 669 | 809 | 606 |
| අම්පාර | 1,099 | 1,180 | 1,071 | 965 | 968 | 1,477 | 976 | 1,099 |
| බදුල්ල | 1,043 | 1,035 | 996 | 887 | 1124 | 979 | 868 | 1,043 |
| මොණරාගල | 807 | 530 | 383 | 844 | 792 | 688 | 283 | 807 |
| කළුතර | 595 | 532 | 201 | 826 | 468 | 483 | 240 | 595 |
| ගාල්ල | 1,341 | 1,162 | 966 | 1,348 | 1420 | 1,638 | 1,572 | 1,341 |
| මාතර | 1,254 | 1,240 | 1,136 | 1,113 | 1282 | 1,390 | 1,421 | 1,254 |
| හම්බන්තොට | 868 | 1,219 | 834 | 1,135 | 792 | 1,005 | 1,165 | 868 |
| ඉංජිනේරු තාක්ෂණ ආයතනය | 1,457 | 437 | 452 | 1,389 | 1522 | 289 | 539 | 1,457 |
| මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය | 700 | 419 | 262 | 765 | 625 | 331 | 270 | 700 |
| ආධුනිකත්ව අභ්‍යාස ආයතනය | 804 | 460 | 784 | 445 | 769 | 409 | 199 | 804 |
| යන්ත්‍රාගාර පුහුණුව | 447 | 4,926 | 3,636 | 1,737 | 568 | 2,915 | 4,727 | 447 |
| අර්ධ කාලීන පාඨමාලා | - | 1,886 | 1,542 | 344 | - | - | - | - |
| | 28,558 | 32,479 | 26,036 | 29,609 | 25363 | 27,780 | 24,769 | 28,558 |

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වර්ෂය අවසානයට අධිකාරියේ මූල්‍ය හා භෞතික කාර්ය සාධන තොරතුරු ඇතුළත් කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබූ අතර බඳවා ගැනීමට ඉලක්කගත ප්‍රමාණයෙන් 75% ක් පමණ ළඟා කරගැනීමට අධිකාරිය සමත් වී තිබුණි. දිස්ත්‍රික් මට්ටමින් බඳවා ගැනීම් ප්‍රතිශතයෙහි අඩුවීම 0.24% සිට 68.71% දක්වා පරාසයක විය. දිස්ත්‍රික්ක 25 න් 19 කම ඉලක්ක කර තිබුණු ප්‍රමාණය බඳවා ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණුව සම්පූර්ණ කරන ආධුනිකයින් සංඛ්‍යාව ඉලක්ක ගතකර නොතිබූ අතර ආධුනිකයින් 26,036 ක් පාඨමාලා සම්පූර්ණ කර තිබූ අතර සහතිකපත්‍ර 16,500 ක් නිකුත් කිරීමට ඉලක්ක කර තිබුණද නිකුත්කර තිබුණේ 15,190 ක් පමණි.

(ඇ) වෘත්තීය මාර්ගෝපදේශන අංශය විසින් වැඩසටහන් 219 ක් මගින් සහභාගිවන්නන් 17,000 ක් දැනුවත් කිරීමට ඉලක්ක කර තිබූ අතර කාර්ය සාධනය මධ්‍යස්ථාන 13 ක වැඩසටහන් 364 ක් මගින් සහභාගිවූ සංඛ්‍යාව 29,991 ක් විය. මෙය ඉලක්ක ගත ප්‍රමාණයට වඩා 12,991කින් හෙවත් 76.42% ක වැඩිවීමක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 17 ක් වැයකර කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 150 දෙනෙකු සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර තිබුණු අතර නිලධාරීන් 618 ක් දේශිය වැඩසටහන් වෙතද, නිලධාරීන් 28 දෙනෙකු විදේශීය වැඩසටහන් වෙතද යොමු කර තිබුණි.

(ඉ) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 36 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කර තිබුණද එකදු වැඩසටහනක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ දුරස්ථ හා ඉංග්‍රිසි අධ්‍යාපනය යටතේ පුහුණුවන්නන් 18,500 ක් පුහුණු කිරීමට ඉලක්ක කර තිබුණද, පුහුණුව ලබාදුන් සංඛ්‍යාව පිළිබඳ තථ්‍ය තොරතුරු විගණනය සඳහා ලබාගත නොහැකි විය. මේ යටතේ දිස්ත්‍රික් කාර්යාල සඳහා පුහුණු පාඩම් මාලා 12,312 ක් බෙදාහැර තිබුණු අතර ඉංග්‍රීසි පාඩම් මාලා 7ක් සකස් කර තිබුණි.

4.2 <u>කළමණාකරන අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආධුනික දීමනා මාසිකව අඛණ්ඩව ගෙවා නොතිබුණු අතර, එම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබුණු ආධුනික දීමනාවල එකතුව රු.34,718,572 ක් විය.

(ආ) අධිකාරිය විසින් රේගු ගාස්තු ලෙස රු. 2,940,000 ක් ගෙවා ජීප් රථයක් මිලදී ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මෙම වාහනය අළුත්වැඩියාව සඳහා රු.2,263,362 ක් වැයකර තිබුණි. මෙම රථය 2010 ජුනි 10 දින අනතුරකට පත් වී තිබූ නමුත් අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීම, සිදුවූ අලාභ හානිය ගණනය කිරීම , මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ හානි පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම හා රක්ෂණ වන්දි ලබාගැනීම යන කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) 2010 පෙබරවාරි 23 දින රේගු ගාස්තු ලෙස රු.1,134,000ක් ගෙවා අධිකාරියට ලබාගෙන තිබුණු මෝටර් රථයක් 2012 අගෝස්තු මාසය වන විටත් භාවිතයට නොගෙන ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයෙහි ගාල්කොට තිබුණි.

(ඇ) අධිකාරියේ පරිශ්‍රය තුළ ඉදිකර තිබූ දුරකථන ආයතන තුනක හුවමාරු කුළුණු සඳහා විධිමත් පරිදි එම ආයතන සමග ගිවිසුම්වලට එළඹ නොතිබුණි. වර්ෂයේ ලැබියයුතු ආදායම් නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලැබෙන සියලුම මුදල් වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ බවද විගණනයේදී අනාවරණය විය.

(ඉ) බඳවා ගන්නා ආධුනිකයින් සංඛ්‍යාව වැඩි කිරීමේ අරමුණින් ප්‍රචාරක කටයුත්තක් ලෙස කොටස් 12 කින් යුත් ඒකාංගික ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීමට ආයතනය විසින් රු.847,500 ක් වැය කර තිබුණද එය 2012 සැප්තැම්බර් මාසය වන විටත් විකාශය කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයේ අධිකාරියට අයත් ජංගම ගිණුම් 12 ක රු. 1,072,313 ක සිට රු.11,212,787 ක් දක්වා බැංකු ශේෂයන් පැවති අතර 2011 දෙසැම්බර් 31 දින වන විට එම ශේෂයන්ගේ එකතුව රු.37,648,088 ක් විය.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

අධිකාරියට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේදී අවම මිල ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කිරීමට හේතු නොදක්වා වැඩි මිල ගණන්වලට මිලදී ගැනීම නිසා අවස්ථා දෙකකදී රු.799,575 ක පාඩුවක් සිදුවී තිබුණු අතර වාහන අලුත්වැඩියාවලදී ඉදිරිපත් වූ අවම මිලට වඩා වැඩි මිලකට අලුත්වැඩියාවන් සිදුකිරීම නිසා අවස්ථා 8 කදී රු.524,976 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සේවකයින් 9 දෙනෙකු වෙනත් ආයතනවල සේවය සඳහා සේවයෙන් නිදහස් කර තිබූ අතර ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේ රු.1,527,708 ක් හා ඉකුත් වර්ෂවලදී රු.4,167,004 ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් පදනම මත අධිකාරියට බඳවාගත් 04 දෙනෙකු බඳවාගත් දින සිටම වෙනත් ආයතනවලට මුදාහැර තිබුණි.

## 4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| සේවක වර්ගය | 2011 අනුමත | 2011 තථ්‍ය | 2011 පුරප්පාඩු / (අතිරික්තය) | 2011 අතිරික්තය | 2010 අනුමත | 2010 තථ්‍ය | 2010 පුරප්පාඩුව / අතිරික්තය | 2010 අතිරික්තය |
|---|---|---|---|---|---|---|---|---|
| විධායක ශ්‍රේණිය | 138 | 88 | 50 | - | 138 | 95 | 43 | - |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | 515 | 466 | 49 | - | 515 | 494 | 21 | - |
| කණිෂ්ඨ | 110 | 97 | 13 | - | 110 | 103 | 7 | - |
| අනියම් | - | 119 | | 119 | - | 127 | | 127 |
| | 763 | 770 | 112 | 119 | 763 | 819 | 71 | 127 |

4.7 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

4.7.1 සමාලෝචිත වර්ෂයේ දී සිදු වූ හදිසි අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණ සිදුකර අලුත්වැඩියාව සඳහා වැය වූ මුදලින් ලද රක්ෂණ වන්දි මුදල් අඩුකර හිඟ මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට රු.113,111 ක අලාභයක් සිදුවී තිබුණි.

4.7.2 2010 ජුනි 23 දිනැති අධිකාරියේ සභාපතිවරයාගේ ලිපියේ උපදෙස් ප්‍රකාරව අලුත්වැඩියා වියදම රු.5,000 ඉක්මවන අවස්ථාවලදී ඒ සඳහා ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මිල කැඳවීම් සිදු කළ යුතු බව දක්වා තිබුණත් අවස්ථා 49 ක දී එක් ආයතනයකින් පමණක් මිල කැඳවීම් ලබාගෙන අලුත්වැඩියා වියදම් වශයෙන් රු.1,165,709 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2002 මැයි 24 දිනැති අංක පීඑෆ් /පීඊ / 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 06 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 06 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී.

5.2 සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5:1:2 ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂ 05 සඳහා පිළියෙල කරනු ලබන සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය 2011 ජනවාරි 17 දින අනුමත කර තිබුණි. 2011 වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි දක්වා තිබුණු ඇස්තමේන්තුගත ඉලක්කයන් සම්පූර්ණ කරගැනීමට අධිකාරිය සමත්වී නොතිබුණි.

5.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අය වැය ලේඛණයේ ඇස්තමේන්තු ගත වියදම් සහ තථ්‍ය වියදම් අතර 10% සිට 174% ක් දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ අතර අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර ආයතනයේ අවධානයට යොමුකරවා ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම්
(ආ) මුදල් හා බැංකු ගිණුම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) වාහන උපයෝජනය
(ඊ) ආධුනිකයින් සහ පුහුණු කටයුතු
(උ) කාර්ය මණ්ඩල කළමනාකරණය
(ඌ) සුභසාධන අරමුදල් පාලනය
(එ) තොග පාලනය

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ
2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව
1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

## 2. මූල්‍ය ප්‍රකාශන.

### 2.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත.

(අ) ප්‍රමිත අංක 02

අප අධිකාරිය වාණිජ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන ආයතනයක් නොවන බැවින් තොග පිරිවැය අගයට ගණනය කරනු ලබයි.

(ආ) ප්‍රමිත අංක 24

2011 වසරේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපුම් කරන ලද විලම්භිත ආදායමේ වෙනස මූල්‍යමය කටයුතු යටතේ පෙන්වා ඇති අතර එය 2012 අවසන් ගිණුම් සකස් කිරීමේදී මූල්‍යමය නොවන කොටසට සඳහන් කරන බව දන්වා සිටිමි.

### 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු.60,512 ක් ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ඉතිරි කිරීමේ ගිණුමේ පොළී ආදායම වන අතර එය ලේඛනයේ සටහන් ව නොමැති අතර නිවැරදිව අවසන් ගිණුම් වල දක්වා ඇත.

(ආ) 2011. 12.31 දිනට බැංකුව අයකරන ලද ගාස්තු ශේෂ 2012 ට ගැලපිම් කර ඇත.

(ඇ) 2012 වර්ෂයේ දි නිවැරදි කර ඇත.

(ඈ) අධිකාරියට අයවිය යුතු මුදල් පාරිතෝෂික මුදල් ගෙවන අවස්ථාවේදී අයකරගෙන ඇත. එහෙත් සමහර නිලධාරින්ගෙන් අධිකාරියට අයවිය යුතු මුදල් පියවීම ප්‍රමාදවීම හේතුවෙන් සහ නීතිමය ගැටළු මතුවීම නිසා එක් මාසයක් තුල පාරිතෝෂික මුදල් ගෙවීම අපහසුවී ඇත.

(ඉ) 2008 සහ 2009 වර්ෂවල නිසි පරිදි ගිවිසුම් අත්සන් කර නොතිබීම නිසා නිශ්චිත මුදලක් සඳහන් කිරීම අපහසු වී තිබූ බැවින් ලැබූ මුදල පමණක් ආදායම ලෙස ගෙන ඇත. මේ වන විට නිසි පරිදි ගිවිසුම් අත්සන් කර ඇති අතර ඒ අනුව නිවැරදිව ආදායමට ගෙන ඇත.

(ඊ) 2012 වර්ෂයේ සිට VAT අයකර දේශිය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට කටයුතු කර ඇත.

(උ) කටුනායක පුහුණු මධ්‍යස්ථානය සහ වැල්ලවත්ත පුහුණු ආයතනය අධිකාරිය වෙත පවරා ගන්නා තුරු ගොඩනැගිලිවල අගය ගිණුම්ගත කළ නොහැකිය.
බේරුවල පුහුණු මධ්‍යස්ථානය විදුලි සංදේශ නියාමක කොමිෂන් සභාවට අයත් ඉඩමක පිහිටි ගොඩනැගිල්ලක කුලී රහිතව පවත්වාගෙන යනු ලැබේ. කල්මුණේ පුහුණු මධ්‍යස්ථානය කුලියට ලබාගෙන ඇත. ඒ අනුව අධිකාරියට අයත් නොවන බැවින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කළ නොහැක.

(ඌ) 2012 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දි නිවැරදි කරඇත.

(එ) රජයේ තක්සේරුව අනුව රු. 1,400,000/- වටිනා ඉඩම සින්නක්කර අයිතිය අධිකාරිය වෙත පවරා ඇති අතර රු.30,000/- මුදලක් ඇපකරුවන්ගෙන් අයකර ඇත. ඉතිරි මුදල අයකර ගැනිම සඳහා නිතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා නිති කටයුතු ආරම්භ කර ඇත.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

(අ) 2012 ඔක්තෝම්බර් 31 දිනට එම ශේෂ නිරවුල් කර ඇත. මෙම වසරට අදාල ගණුදෙණු සහ වෙනත් ගෙවීම් සම්බන්ධයෙන් 2010 පෙර සිදු වූ ගණුදෙනු සඳහා 2012 මූල්‍ය ප්‍රකාශය සකස් කරන විට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) සමහර ශේෂයන් අතර වෙනස්කම් අර්ධකාලින ගිණුම් ශේෂයන් වේ. බැංකු ගිණුම් වල ශේෂයන් බැර ශේෂයන් වී ඇති නම් එම ශේෂයන් විවිධ ණයගැතියෝ යටතේ පෙන්වා ඇත.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලිපියැවිම තුලින් හා සිහිකැඳවීම් තුලින් මෙම ශේෂ නිරවුල් කිරීමට උත්සාහ දැරූවද අදාල පාර්ශවයන් ප්‍රතිචාර නොදැක්වීම ශේෂ නිරවුල් කිරීම ප්‍රමාදවීමට හේතුවක් වී ඇතත් නිරවුල් කිරීමට ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන, කඩිනම් කරන බව දන්වා සිටිමි.

(ආ) පැරණි ශේෂ ලියාහැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමැතිය ගෙන නිරවුල් කිරීමට කටයුතු කර ඇති බැවින් එම ක්‍රියාවලිය අවසන් වූ පසු මෙම ගැටළුව නිරාකරණය වේ.

(ඇ) 2011. 12.31 දිනට ණයහිමි ශේෂවල එකතුව රු.33,417,017/- ක් වූ අතර එයින් 2012. 11. 16 දින වන විට රු. 12,369,893.82 ක් නිරවුල් කර ඇත. නිරවුල් නොවූ රු.21047123. 18 න් රු. 14,268,317. 18 ක් අභ්‍යන්තර ගනුදෙනු වේ. මේ වන විට නිරවුල් නොවූ අභ්‍යන්තර ගනුදෙනු නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) **තොගය**
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා ,සමීක්ෂණ මණ්ඩල වාර්තා උපලේඛන සකස්කරඇත.

**ඉඩම්**
අයිතිය පවරාගෙන ඇති සියලු ඉඩම් සඳහා හිමිකම් ඔප්පු සහ ලේඛන නීති අංශය සතුව ඇත. අයිතිය පවරා ගත යුතුව ඇති ඉඩම් කිහිපයක් සම්බන්ධයෙන් මේ වන විට අදාල කටයුතු කරමින් සිටී.

**අත්තිකාරම්, විවිධ ණයගැතියෝ, ණයහිමියෝ**
ලිපි යැවීම්, සිහිකැඳවීම් කලද අදාල පාර්ශවයන් ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් ශේෂ සහතික ඉදිරිපත් කිරීම ගැටලුවක් වීඇත.

**බැංකු හා මුදල් ශේෂ**
ශේෂ සනාථ කිරීම් ලිපි ඇත.

**ස්ථාවර තැන්පතු**
ස්ථාවර තැන්පත් සහතික ඇත.

## 2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම්

### (අ) නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව

**2008 ජනවාරි 0 1 දිනැති අංක 1530/3 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය.**

මුද්දර ගාස්තු අය කිරිම පිළිබඳව සියලුම අංශ දැනුවත් කර ඇති අතර ඉදිරියේ දි මුද්දර ගාස්තු අය කිරිම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගෙන ඇත. 2011 වසර සඳහා මුද්දර ලබා නොගත් ආයතන වෙත ලිපි මඟින් දැනුම් දී ඒ සඳහා මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කර ඇත.

### (ආ) ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි

i අංක 188 (2)

මෙය මුදල් ඇනවුම් සඳහා අයවිය යුතු ව තිබූ මුදලක් වන අතර 2009 වසරේදී රු. 70,7 1 1/=ක් අයවීමෙන් අනතුරුව ඉතිරිව තිබූ මුදල් වන අතර එය නිරවුල් කර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරන ලෙස අදාල නිලධාරින් දැනුවත් කර ඇත.

ii අංක 264 ( 1)

මුදල් අයකැමි මඟින් මුදල් ගෙවා ඇති අතර, වැටුප් අංශය ලේඛණ මත අත්සන් තබා එම මුදල් ගෙවා ඇත. සෑම ගෙවීමකටම කුවිතාන්සි ලබා ගැනීමට පරිපාලන අංශය දැනුවත් කරන ලදි. ඒ සඳහා ඔවුන් ක්‍රියා මාර්ග ගෙන ඇත.

iii අංක 37 1 (2) (ඇ)

දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම කළ විගසම පියවීමට අදාල නිලධාරින්ට උපදෙස් දි ඇත.

iv අංක 396

වලංගු කාලය ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාර කටයුතු කර ඇත.

### (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

i 1992 අගෝස්තු 17 දිනැති අංක 26/92 හා 1997 අගෝස්තු 03 දිනැති අංක 26/92( 1)

වාහනවල රාජ්‍ය ලාංජනය සහ ආයතනයේ නම ඇතුලත් ස්ටිකරයක් අලවා ඇත.

ii 1999 ඔක්තෝම්බර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛයේ 1. 1.6(v) හා 1.3. 1(iii) වගන්තිය

අධ්‍යක්ෂකවරු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරු, සඳහා දැනට සංචිත වාහනයක් යොදවා ප්‍රවාහන පහසුකම් සැපයීම කර ඇත. ඉදිරියේදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. රාත්‍රි කාලයේදි වාහන නවතා තැබීම සඳහා ආයතන ප්‍රධානින්ගේ අවසරය ලබා ඇත.

**(ඈ) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ**

2003 ජුනි 02 දිනැති පිරඩ්/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 යන වගන්ති අමාත්‍යාංශය වෙත මුදාහැර තිබූ HB- 160 1 දරණ වාහනය 20 12 ජූලි මාසයේ සිට අධිකාරිය වෙත ලබාගෙන ඇත.

**(ඉ) 2006 ජනවාරි 25 දිනැති අංක එන්පීඒ/8 ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ චක්‍රලේඛය**

i **3. 1.4, 3.2.2 සහ 3.4.2 වගන්ති**

ප්‍රසම්පාදන අත්පොතෙහි උපදෙස් අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී හැකිතාක් දුරට තරඟකාරීව මිලගණන් කැඳවා කාර්‍යක්ෂම ලෙස කලට වේලාවට ආර්ථිකමය වශයෙන් ලාබදායක වඩාත් සුදුසු භාණ්ඩ මිලදිගැනීමට කටයුතු කර ඇත.

රේඛීය අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය අනුව අධිකාරිය සඳහා සුලු පරිමාණ සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු පත්කර තිබූ අතර ප්‍රසම්පාදන අත්පොතෙහි උපදෙස් අනුව අනුමත කළහැකි සීමාවන්ද ලබාදී තිබුණි.

ii **3.4. 1(ඈ) වගන්තිය**

හැකි සෑම ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පස්දෙනෙකුගෙන් වත් මිලගණන් කැඳවීමට කටයුතු කර ඇති අතර උතුරු නැගෙනහිර පළාත්වල එවැනි කොන්ත්‍රාත්කරුවන් ප්‍රමාණයක් සොයාගැනීමට නොහැකි අවස්ථාවකදී අඩු මිළගණන් ලබාගත් අවස්ථාවන් කිහිපයක් තිබිය හැක.

iii **8. 13.3 වගන්තිය**

කොන්ත්‍රාත් විචලනය අනුමත අසම්භාව්‍ය වෙන්කිරීම් සීමාවවන 10% සිට කොන්ත්‍රාත් වටිනාකමින් 30% දක්වා ආයතන ප්‍රධානියාගේ අනුමැතියෙන් කාර්ය ඉටුකර හැකි බව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හිද දැක්වේ.

## 2.2.7 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

නිළධාරින්ගේ වාර්ෂික නිවාඩු සහ අතිකාල දීමනා සම්බන්ධයෙන් පමණක් සාප්පු හා කාර්යාල සේවක පණතේ විධි විධාන අනුගමනය කිරීම සඳහා මණ්ඩල පත්‍රිකාවක් මඟින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇත.

## 2.2.8 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) මෙම නිලධාරින් පුහුණු පාඨමාලාවන්ට සහභාගි කරවීමේදී පුහුණු අවශ්‍යතාව හඳුනාගෙන ඔවුන්ගේ කැමැත්ත මත විධිමත් අනුමැතියකින් සහ ගිවිසුම්ගත බැඳීමකට යටත්කර පුහුණුවට යොමු කර ඇති බව කාරුණිකව දන්වමි.

එම නිළධාරින් ස්ථිර කාර්ය මණ්ඩලයේ බැවින් පුහුණුවට යොමුකර ඇති අතර ඉදිරියේ දී දීර්ඝකාලින පාඨමාලා ලබාදීමේ දී සේවා කාලය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු බවට උපදෙස් දෙන ලදි.

(ආ) අයකරගත නොහැකිවූ මුදල් අයකරගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3. 1 මූල්‍ය ප්‍රතිඵල

20 1 1 වසර අවසන් ගිණුම් වලට අනුව

| | |
|---|---|
| ආදායම් ලැබීම් වැඩි වී ඇත්තේ | 44,967,229.55 |
| වියදම් වැඩිවීම | 1 15,796,702.79 |
| | 70,829,473.24 |

ඒ අනුව 20 10 වසරට වඩා ලැබීම් අඩුවී ඇතත් වියදම් විශාල වශයෙන් වැඩි ඇති නිසා ඌනය වැඩිවී ඇත.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කෙරිගෙන යන වැඩ යටතේ තිබූ ගොඩනැගිලි වැඩ අවසන් කර ඇති බැවින් ගොඩනැගිලි ගිණුමට ගෙන ඇති නිසා දේපල වල වටිනාකම වැඩි වී කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ වල වටිනාකම අඩු විය.

භාණ්ඩ මිලදී ගැනිම සඳහා ගෙවන ලද මුදල් සඳහා භාණ්ඩ 20 12 වසරේදී ලැබී ඇත.

ගෙවිය යුතු තැන්පත් සහ ගෙවිය යුතු වියදම් 20 10 වසරට වඩා 20 1 1 වසරේදී වැඩි වී ඇත.

පුහුණු ආයතන අළුතින් ඇරඹිණි. ස්ථාවර වත්කම් වැඩියෙන් මිලදී ගෙන ඇති අතර අපගේ අය වැයට අනුව ප්‍රාග්ධන මුදල් වැඩියෙන් වැඩියෙන් මිලදී ගැනිමට හැකි විය. ඒ අනුව විලම්භිත ආදායම් වැඩිවේ.

විදුලිය, ජල බිල්පත්, ආයතන පරිශ්‍රයන් සඳහා බදු කුලී වැනි වියදම්, පුහුණු අමුද්‍රව්‍ය සහ මිලදී ගැනිමට සිදුවන බොහෝ ද්‍රව්‍ය අදාල ආයතන විසින් වරින් වර සිදුකරනු ලබන ගාස්තු සංශෝධන අනුව වැඩිවේ. අපගේ පාලනයෙන් බැහැර හේතූන් මතද මෙසේ සිදුවිය හැක.

### 3.3 වියදම්වල වැඩිවීම හා ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

වියදම්වල වැඩිවීම හා ප්‍රාග්ධන බාදන අවස්ථාවන්

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4. 1 කාර්යය සාධනය

#### 4. 1. 1

(අ) දිස්තික් කාර්යාල සඳහා ප්‍රමාණවත් පරික්ෂකවරුන් සංඛ්‍යාව නොමැතිවීම සහ පුහුණුව සඳහා යොමුකිරීමට ඉල්ලුම්කරුවන් නොමැති වීම නිසා ඉලක්කගත ප්‍රමාණය සපුරා ගැනිම අපහසුවිය.

ආ) අප අධිකාරියේ බඳවා ගැනිම ඕනෑම දිනයක සිදුවේ. එබැවින් සාම්ප්‍රදායිකව බඳවා ගැනීමේ ඉලක්කයන් සාදන අතර පුහුණුව අවසන් කිරීමේ ඉලක්කයක් සාදා නැත.

සමහර අවස්ථා වල ඉල්ලුම්කරුවන් අවසන් පරීක්ෂණයෙන් අසමත් විය හැක. එවිට නැවත පරීක්ෂණය පවත්වා සහතික නිකුත් කරනු ලබන අතර අවසන් මාස කිපය තුල මෙවැනි අවස්ථා වල සහතික නිකුත් කිරීම 20 12 දක්වා දිර්ඝ වීමට ඉඩ තිබේ.

පුහුණුව අතරවාරයේදී ආධුනිකයින් පුහුණුව අතහැරයාම සිදුවිය හැකි අතර එවිට පවත්වන අවසාන පරීක්ෂණ සංඛ්‍යාව අඩුවන බැවින් නිකුත් කරන නිපුණතා සහතික ප්‍රමාණය අඩුවේ. අවසන් මාසකිහිපය තුල ග්‍රාමීය සහ ස්ථානානුරූපී ආධුනිකයන්ගේ දත්ත වාර්තා ලැබීමට ප්‍රමාද වූ විට සහතික නිකුත් කිරීම ඊලඟ වර්ෂය දක්වා ප්‍රමාද විය හැක.

(ඇ) වැඩසටහන 295ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්කගත කරන ලද අතර,364 ක් සිදුකර ඇත. එයට හේතුවූයේ දිස්ත්‍රික් කාර්යාල බිහිවීම, දිස්ත්‍රික් කාර්යාලවල පුහුණුලාභීන් වැඩි කර ගැනීමට කටයුතු කිරීම, ප්‍රදේශීයව ප්‍රචාරක වැඩසටහන් ලෙස භාවිතය, සහභාගිවන්නන්ගේ සංඛ්‍යාවවැඩිවීම, පාසල් වෘත්තිය මාර්ගෝපදේශන නිළධාරින්ගේ වැඩසටහන් සඳහා දැඩි ඉල්ලුමක් පැවතීම යනාදි කරුණුවේ.

(ඈ) පරිපාලන සහ මූල්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී නිළධාරීන් වැඩි ප්‍රමාණයක් සහභාගි කරවූ අතර එම වැඩ සටහන් ප්‍රධාන කාර්යාලයේ පැවැත්වීම තුලින් පිරිවැය අඩුවීම සහ එලෙසවැඩි ප්‍රමාණයක් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට හැකිවීම.

(ඉ) ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 05ක් කෑගල්ල, පුත්තලම, ගම්පහ, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුල ක්‍රියාත්මක කොට තිබුනි. පරිපාලනමය හේතු මත මෙම වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය දැක්වීම අතහැර ඇත.

(ඊ) ව්‍යවසායකත්ව සංවර්ධන අංශයෙන් ඉලක්ක කර තිබූ පාඨමාලා පැවැතවීම සඳහා සම්පත් දායකයින් හිඟකම සහ දිස්ත්‍රික් කාර්යාල සඳහා පරීක්ෂකවරුන් හිඟකම නිසා ඉලක්ක කරා ලඟාකර ගැනීම අපහසු විය.

## 4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ) මාසික වියදම් අවශ්‍යතාවය අනුව රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශයක්ද සමඟින් මහා භාණ්ඩාගාරයේ මුදල් ඉල්ලුම් කරනු ලැබේ.

(ආ) මෙම වාහන සඳහා රේගු ගාස්තු ශ්‍රී ලංකා රේගුවේ තක්සේරුවට අනුව රේඛීය අමාත්‍යාංශය සහ මහාභාණ්ඩාගාරයේ එකඟවීම මත ගෙවා ඇත.

මෙම වාහනය මෙදින කිසිදු අනතුරකට භාජනය වී නොමැති බැවින් මු.රෙ. 104 ප්‍රකාරව පරීක්ෂණයක්ද අවශ්‍ය නොවේ.

මෙම රථය අනතුරකට භාජනය වී නොමැති බැවින් එවැනි අළුත්වැඩියවකට අදාල කිසිදු ගෙවීමක් කර නොමැත. මෙදින වන විට රියදුරෙක්ද අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) 20 10 පෙබරවාරි 23 දින අධිකාරියට ලබාගෙන තිබුණු වාහනය අළුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බැවින් මේ දක්වා අළුත්වැඩියා සිදු කර නොමැත. මේ සඳහා පත්කරන ලද කමිටු නිර්දේශය වූයේ එම වාහනය ආධුනිකයින්ගේ පුහුණුවසඳහා අවශ්‍ය ද්‍රව්‍ය (Training consumable) ලෙස යොදා ගැනීමටය.

(ඈ) 20 12 වර්ෂයේදි අදාල ගිවිසුම් අත්සන් කර ඇති අතර නිශ්චිත ආදායම 20 12 වර්ෂයේ අවසන් ගිණුම්තුල ඇතුලත් කිරීමට කටයුතු කර ඇත.

(ඉ) ඒකාංගික ටෙලි නාට්‍යය මාර්ගෝපදේශන වැඩසටහන සඳහා උපයෝගි කරගත හැකි ආකාරයෙන් සංස්කරනය කිරීමට අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීමේදි උපදෙස් දි ඇත.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

වර්ෂයක් අවසානයේදී භාණ්ඩාගාරය මගින් සපයන ලබන මුදල් ජනවාරි මුල් සති 02 තුල නොලැබෙන හෙයින් සහ උපචිත කරනු ලබන වියදම් සඳහා ගෙවීම් කිරීමට නව වර්ෂයට මුදල් ලැබෙන තෙක් අත්‍යවශ්‍ය වියදම් සඳහා මුදල් රඳවාගැනීමට සිදුවේ.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

අදාල Desktop පරිගණක මිලදී ගැනීමේ දී අවම මිල ඉදිරිපත් කර තිබූ Metropolitan ආයතනයේ පිරිවිතර හා නොගැලපේ. තවද මිල ගණන් ඉදිරිපත් කරන පලමු අවස්ථාවේ ඉල්ලුම් කල පිරිවිතරයන්ට අනුකූල නොවන මිල ගණන් Non Responsive Bid වශයෙන් තාක්ෂණික ඇගයීම් අවස්ථාවේ දී ඉවත් කරනු ලැබේ. ඒ අනුවද මිල ගණන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කල නොහැක. දිවයින පුරාම පිහිටි පරිගණක පුහුණු මධ්‍යස්ථාන සඳහා පරිගණක මිලදී ගත් නිසා, ඒ පිළිබඳව සලකා බලා ඇත. Metropolitan Office (Pvt) Ltd. ආයතනයේ සේවා මධ්‍යස්ථාන 11 ක් ඇති අතර,අම්පාර, වවුනියා,මුලතිව්, කිලිනොච්චි වැනි උතුරු නැගෙනහිර පලාත් වල ඔවුන්ගේ සේවා ආයතන නොමැත. PC House PLC ආයතනයේ දිවයින පුරා විහිදුන සේවා ආයතන 34ක් පමණ ඇති බැවින් මෙම ආයතනයෙන් පරිගණක මිලදී ගැනීමට එයද හේතු විය.

ඉහත කරුණු සැලකිමේදී රු. 47,400/- බැගින් පරිගණක මිලදී ගැනිම නිසා ආයතනයට ආර්ථික වශයෙන් අවාසියක් සිදුවී නොමැත.

ඉදිරියේ දි අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කරන මිලට වඩා වැඩි මිල ගණන් වලට අළුත්වැඩියා කටයුතු සිදුකරන්නේ නම් සුදුසුකම් ලත් තාක්ෂණික නිළධාරියකුගෙන් ලබා ගන්නා තාක්ෂණික වාර්තාව මත පදනම්ව එම කටයුතු සිදු කරමි.

## 4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

එක් නිලධාරියෙකුගේ වැටුප අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කරනු ලබන අතර තවත් අයෙක් අධිකාරියේ සේවයට වාර්තා කරනු ලබයි. දෙදෙනෙක් සේවයෙන් ඉවත්ව් ගොස් ඇත. ඉතිරි අයගේ වැටුප් ප්‍රතිපූර්ණය කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කර ඇති අතර ඉදිරියේදී එම මුදල් ප්‍රතිපූර්ණය කරනු ඇත .

## 4.6 කාර්යය මණ්ඩල පරිපාලනය

2012 වර්ෂය අවසාන වනවිට විධායක ශ්‍රේණියේ තනතුරු 03 ද ලිපිකරු හා සමාන්තර ශ්‍රේණියේ තනතුරු 102 ද, කණිෂ්ඨ ශ්‍රේණියේ තනතුරු 22ක්ද බඳවාගෙන ඇත.

## 4.7 වාහන උපයෝජනය

4.7.1 ඉදිරියේ දි වාහන හදිසි අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කරමි.

4.7.2 එම ඇමුණුමෙහි විස්තර වල වාහන අළුත්වැඩියාව සඳහා දැරූ වියදම මෙන්ම වාහන සේවා කිරිම් වෙනුවෙන් දැරූ වියදම් ද ඇතුලත් කර ඇත.

4.7.3 ඉවත් කරන ලද අමතර කොටස් විධිමත් ලෙස ලේඛණගත කිරිමට අදාල නිලධාරින් වෙත උපදෙස් දෙන ලදි .

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

අතින් කරගෙන යන ගිණුම් පරිගණක ගත කරන ලද අතර ජාතික ආයතන හා දිස්ත්‍රික් කාර්යාල ඒකාබද්ද කිරීමටද කටයුතු කරන ලදි ඒ අනුව 20 12 වසරේදී ප්‍රගතියක් ලබා ඇත.

### 5.2 වාර්ෂික සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා ඇස්තමේන්තුගත ඉලක්කයන් සපුරාගැනීමට නොහැකි විය. ඉදිරියේදී ප්‍රතිපාදන නොලැබීම මත සැළසුම් කළ නමුත් ක්‍රියාත්මක කළ නොහැකි ප්‍රමාණයන් සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ඇත.

### 5.3 අභ්‍යන්තර විගණනය

20 1 1 වර්ෂය තුළ සේවයෙන් විශ්‍රාමයෑම, ඉවත්වීම සහ පාරිතෝෂික ගෙවීම් සංඛ්‍යාව වැඩිවී තිබූ අතර ඒ සම්බන්ධයෙන් 100% ක් පරික්ෂා කළ යුතුව තිබුණි. කොන්ත්‍රාත් ගෙවීම් පරික්ෂා කටයුතු වසර පුරා වැඩි ප්‍රමාණයක් තිබූ අතර එහිද 100% ක් පරික්ෂා කිරීම් කටයුතු කළයුතුව තිබුණි.

වාර්ෂික විගණන සැළැස්මට අනුව විගණන විමර්ශන 17 කට වඩා වැඩි සංඛ්‍යාවක් කර ඇති බව දන්වමි.

කාර්ය මණ්ඩලය සම්පූර්ණ වී නොමැති වුවත්, 20 12 වර්ෂය තුල වාර්ෂික විගණන සැලැස්මට අනුව වැඩි ප්‍රතිශතයක් විමර්ශණ සිදුකර ඇත.

### 5.4 අයවැය පාලනය

විදුලිය, ජල බිල්පත්, ආයතන පරිශ්‍රයන් සඳහා බදු කුලි වැනි වියදම්, පුහුණු අමුද්‍රව්‍ය සහ මිලදී ගැනීමට සිදුවන බොහෝ ද්‍රව්‍ය අදාල ආයතන විසින් වරින් වර සිදුකරනු ලබන ගාස්තු සංශෝධන අනුවවැඩිවේ. අපගේ පාලනයෙන් බැහැර හේතූන් මතද මෙසේ සිදුවිය හැක.

## 6. පද්ධති හා පාලන

විගණනය මඟින් පෙන්වා දී ඇති දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමුකර නිවැරදි කිරීම් සහ මෙවැනි අඩුපාඩු හා දුර්වලතා මඟහරවා ගැනීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.